din-02-09-uns-009331-20x4-pnf

# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

## පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් සේවාවේ සහකාර වතු කළමනාකරු (ආ.පො.උ.) JM 1-2 (කොන්ත්‍රාත්) සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

## සහකාර වතු කළමනාකරු (ආ.පො.උ.) JM 1-2 (කොන්ත්‍රාත්)

සහකාර කළමනාකරු (වතු) – ආ.පො.උ. තනතුර සඳහා කාර්යසාධනය මත වසරින් වසර දීර්ඝ කිරීමට යටත්ව කොන්ත්‍රාත් පදනම මත වර්ෂ 03 ක් සඳහා සහකාර වතු කළමනාකරු (අ.පො.උ) JM 1-2 සඳහා බඳවා ගැනීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම/වැවිලි කළමනාකරණ උපාධිය සහ රජයේ හෝ රජය පිළිගත් ආයතනයක පොල් වතු කළමනා කරණය පිළිබඳ වසර 04 ක සේවා පළපුරුද්දක් ලබාතිබීම.

- කාර්යසාධනය මත වසරින් වසර දීර්ඝ කිරීමට යටත්ව කොන්ත්‍රාත් පදනම මත වසර 03 ක් සඳහා සහකාර වතු කළමනාකරු (අ.පො.උ) JM 1-2 තනතුරට බඳවා ගනු ලැබේ.
  - වැටුප : රු. 43,355 /– (කනිෂ්ඨ කළමනකාරණ (JM 1-2) සේවා ශ්‍රේණියේ ආරම්භක වැටුප)
  - තනතුරු සංඛ්‍යාව : 04 (කොන්ත්‍රාත්)
  - බඳවා ගැනීමේ ක්‍රමවේදය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ

**වෙනත් කොන්දේසි :**

I. සෑම ඉල්ලුම්කරුවෙක් ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත්**

ඒ අනුව 2024.02.26 දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කරගත් ආකෘතියක් භාවිතාකර අයදුම්පත් යොමුකළ යුතුවේ. එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කිරීමත් අනිවාර්ය වේ. එසේ ඉල්ලුම් කරනු නොලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම අයදුම්පත් 2024.02.26 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "**සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසු කමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

ඉහත තනතුර සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. යම අපහසුතාවයක් ඇති වුව හොත් තමන් විසින් සකස් කරගත් ආකෘතියක් භාවිතාකර අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි. https://coconutsrilanka.lk/